# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.11.22 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2021 ඔක්තෝබර් මාසයේ දී ඉහළ ගියේය

**මතුපිට උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 8.3%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.7%
මාසික වෙනස : 2.12%

**මූලික උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 7.2%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.6%
මාසික වෙනස : 2.3%







ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 6.2හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 8.3 දක්වා ඉහළ ගියේය. මේ සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් හේතු විය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 10.0හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 11.7 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 3.0හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 5.4 දක්වා ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස, 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 5.5හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 5.7 දක්වා ඉහළ ගියේය.

2021 ඔක්තෝබර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස 2.12ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙළින්, සියයට 0.89කින් සහ සියයට 1.23කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2021 ඔක්තෝබර් මාසයේ දී ආහාර කාණ්ඩය තුළ, කිරි පිටි සහ සහල් මිල ගණන් ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ, ප්‍රධාන වශයෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන (එල්.පී ගෑස් සහ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය), ආපනශාලා සහ හෝටල්, විවිධ භාණ්ඩ සහ සේවා සහ සෞඛ්‍ය යන උප කාණ්ඩවල අයිතමවල මිල ගණන් 2021 ඔක්තෝබර් මාසයේ දී ඉහළ ගියේය.

තවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 4.8හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 7.2 දක්වා ඉහළ ගිය අතර, 2021 සැප්තැම්බර් මාසය දක්වා සියයට 4.4ක් ලෙස අඛණ්ඩව මාස 6ක් තුළ නොවෙනස්ව පැවති වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 4.6 දක්වා ඉහළ ගියේය.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

**දත්ත ඇමුණුම**

## සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

### පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 | 4.9 | 5.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 | 5.1 | 5.0 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 | 5.2 | 4.8 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 | 5.6 | 4.6 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 | 5.9 | 4.5 |
| | අගෝස්තු | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 | 6.1 | 4.4 |
| | සැප්තැම්බර් | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 | 6.2 | 4.3 |
| | ඔක්තෝබර් | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 | 6.2 | 4.2 |
| | නොවැම්බර් | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 | 6.3 | 4.2 |
| | දෙසැම්බර් | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 | 6.2 | 4.1 |
| 2021 | ජනවාරි | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 | 5.8 | 4.2 |
| | පෙබරවාරි | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 | 5.5 | 4.2 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 | 5.3 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 | 5.3 | 4.4 |
| | මැයි | 143.6 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 4.2 | 5.4 | 4.4 |
| | ජූනි | 145.7 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 4.1 | 5.4 | 4.4 |
| | ජූලි | 146.6 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 4.4 | 5.4 | 4.4 |
| | අගෝස්තු | 147.1 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 4.7 | 5.5 | 4.4 |
| | සැප්තැම්බර් | 147.5 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 4.8 | 5.5 | 4.4 |
| | ඔක්තෝබර් | 150.6 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 7.2 | 5.7 | 4.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව